CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ශ්‍රී ලංකා රජය සමඟ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය

මාස 48 ක් පුරා ඇමෙරිකානු ඩොලර් බිලියන 2.9 ක වටිනාකමක් සහිත ආර්ථික ගැලපීම් සහ ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිවලට සහාය වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (International Monetary Fund - IMF) ශ්‍රී ලංකා රජය සමඟ විස්තීරණ අරමුදල් පහසුකම් සැලසීමේ වැඩපිළිවෙළක් පිළිබඳ එකඟතාවකට පැමිණ ඇති බව ප්‍රකාශ කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් (Centre for Policy Alternatives- CPA) සාධනීය පියවරවක් වශයෙන් පිළිගනී. ඕනෑම මුදලක් ලබා දීමට පෙර, ජාත්‍යන්තර ණය හිමියන්ගේ සම්මන්ත්‍රණයක්, දේශීය වශයෙන් යම් යම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව අවශ්‍ය බව අපි තේරුම් ගනිමු.

ආර්ථික ගැලපුම් සිදු කිරීමේ පීඩනය අසමාන ලෙස දුගී ජනකොටස් මතට නොපැමිණීම සහතික කිරීම සඳහා සහ රජයට එහි ප්‍රතිපත්තිවල තාර්කිකත්වය සහ අන්තර්ගතය මහජනතාව සමඟ සන්නිවේදනය කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවය සහතික කිරීම සඳහා සුබසාධන ක්‍රියාමාර්ගවල ඇති මූලික වැදගත්කම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නැවත අවධාරණය කරනු ලබයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තරයේ විශ්වාස කරනු ලබන්නේ මේ මොහොතේ අපට අවශ්‍ය වන්නේ ජනතාවගේ විශ්වාසය හා පැහැදීම ඇති, රටේ ජනතාව එක්සත් කළ හැකි මෙන්ම සංහිඳියාව ඇති කළ හැකි ආණ්ඩුවක් පැවතීම බවයි. මේ සම්බන්ධයෙන්, විසම්මුතිය මැඩලීමේ උත්සාහයෙන් සහ විශේෂයෙන් විරුද්ධවාදීන්ට සහ විවේචකයන්ට එරෙහිව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (Prevention of Terrorism Act - PTA) භාවිතා කිරීමෙන් වැළකී සිටින ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් රජයෙන් ඉල්ලා සිටී. නීතියේ ආධිපත්‍යය කඩ කරන්නන්ට එරෙහිව භාවිතා කළ හැකි තවත් නීති ගණනාවක් ශ්‍රී ලංකාවේ තිබේ. එහිදී, භාවිත කිරීම සඳහා තත්ත්වාකාර තහනමක් පනවා ඇති ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තවදුරටත් භාවිතා කිරීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අනවශේෂයෙන්ම හෙළා දකින අතර, ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලද විසම්මුතිය සහ කලකිරීම පිළිබඳ දරුණු හුදෙක් ජනකොටස් අතර බේදීමක් ඇති කිරීම සඳහා යොමු කරනු වෙනුවට මේ රටේ ජනතාව ඉදිරියේ ඇති ආර්ථික අභියෝගවලට මුහුණ දීම සඳහා ඔවුන් සමඟි කිරීමට හා එක්සත් කිරීමට ක්‍රියා කරන ලෙස රජයෙන් දැඩි ලෙස ඉල්ලා සිටී. ඉදිරි දින දහය තුළ පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේ දී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙනු ඇති අතර ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත මෙම සාකච්ඡාවලට ඇතුළත් වනු නොඅනුමානය.

මෙම පෙර නොවූ විරූ රාජ්‍ය පාලන අර්බුදයේ අභියෝගයට මුහුණ දීමේදී පරිපූර්ණ සහ මානව හිමිකම් හිතකාමී ඉදිරි දර්ශනයක් අනුගමනය කරන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී. ජාත්‍යන්තර මුල්‍ය අරමුදල සහ විසර්ජන පනත් කෙටුම්පතේ සංශෝධන මගින් ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කරන නමුත්, වඩාත් වැදගත් වන්නේ ඒවා සාර්ථක වීමට නම් රාජ්‍ය පාලනයේ සහ ආණ්ඩුවේ සුජාතභාවය තහවුරු කිරීමේ දේශපාලන ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කළ යුතු වීමය.

රජය මෙම ඉදිරිදර්ශනය අනුගමනය කර ශ්‍රී ලංකාවේ රාජ්‍ය පාලනය සහ ආණ්ඩුව සඳහා නව සමාජ ගිවිසුමක් සමඟින් රට ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ මාවතට ආරක්ෂිතව ප්‍රවේශ වන ලෙසට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් දැඩි ලෙස ඉල්ලා සිටින අතර එසේ කරනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වේ.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org